ගැටුම් වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ - "බී" සංරචකය

---

1. මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර, මා දරන්නා වූ මතය වනුයේ ;

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2012 දෙසැම්බර් 31 උනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුම්වලින් ආපසු ගැනීම් සහ එම ගිණුම්වලට කරන ලද ඌනපූරණයන් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව ,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව සහ;

(ඊ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 මූල්‍ය කාර්යසාධනය

---------------------

(අ) මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම රු.1,119,279,544 ක් හා ඉකුත් වර්ෂයේ වියදම රු.252,461,586 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,372,576,555 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියඋම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම 2012 | 2011 | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ - ජල සම්පාදන මණ්ඩලය - ණය | 233,427,326 | 76,651,454 | 310,078,780 |
| - ජල සම්පාදන මණ්ඩලය - ප්‍රදාන | 178,185,515 | - | 178,185,515 |
| - ලංකා විදුලිබල මණ්ඩලය | 663,592,082 | 139,171,453 | 802,763,534 |
| උපදේශක සේවා - ජල සම්පාදන මණ්ඩලය | 1,247,914 | 5,038,962 | 6,286,877 |
| වර්ධක මෙහෙයුම් පිරිවැය - | | | |
| - ජල සම්පාදන මණ්ඩලය | 13,258,635 | 4,198,351 | 17,673,071 |
| - ව්‍යාපෘති සම්බන්ධීකරණ හා තත්ත්ව සහතික කිරීමේ ඒකකය | 16,138,361 | 12,520,504 | 29,346,067 |
| - උපකරණ - ව්‍යාපෘති සම්බන්ධීකරණ හා තත්ත්ව සහතික කිරීමේ ඒකකය | 2,985,669 | 1,947,387 | 4,865,193 |
| මූල්‍ය ගාස්තු | | | |
| - බැදීම් ගාස්තු | 5,262,084 | 12,001,715 | 17,263,800 |
| - පොලී | 5,181,958 | 931,760 | 6,113,718 |
| එකතුව | 1,119,279,544 | 252,461,586 | 1,372,576,555 |

## 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පලමු ජනනීය අග්‍රිම අරමුදල් ගිණුම්වල (ණය සහ ප්‍රදාන) මෙහෙයුම් පහත දැක්වේ.

| | ණය | | ප්‍රදාන | |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | රු. | එ.ජ.ඩො. | රු. |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 519,824 | 59,208,665 | 150,000 | 17,085,195 |
| <u>එකතු කළා</u> : ඌනපූර්ණය කිරීම් | 269,592 | 34,535,016 | - | - |
| විදේශ විනිමය වාසිය | - | 7,311,759 | - | 1,968,555 |
| | 789,416 | 101,055,440 | 150,000 | 19,053,750 |
| <u>අඩු කළා:</u> ආපසු ගැනීම් - ව්‍යාපෘති සම්බන්ධීකරණ හා තත්ත්ව සහතික කිරීමේ ඒකකය | 142,453 | 18,460,229 | - | - |
| - ජල සම්පාදන මණ්ඩලය | 151,227 | 19,557,198 | 128,867 | 16,366,460 |
| | 495,736 | 63,038,012 | - | - |
| බැංකු ගාස්තු | 37 | 4,484 | - | - |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 495,699 | 63,033,528 | 21,133 | 2,687,290 |

3. විගණන නිරීක්ෂණ

------------------------

3.1 අරමුදල් ප්‍රතිපූර්ණය කිරීම

-----------------------------

රු.754,566 (එක්සත් ජනපද ඩොලර් 6,638.89) ක් වූ ප්‍රතිපූර්ණ ඉල්ලුම් පත් දෙකක් පහත දැක්වෙන හේතූන් නිසා බැංකුව විසින් රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(i) අනුමත නොකළ කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය

(ii) දෙවරක් හිමිකම් පෑම

3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජල සම්පාදන මණ්ඩලයේ රත්වලම්පත්තු ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කුළුණ, ප්‍රධාන සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ වැඩ සඳහා වූ අතුරු කොන්ත්‍රාත් මුදල වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු.541,643 ක් වූ අතුරු කොන්ත්‍රාත් මුදල උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එම හේතුවෙන් සිවිල් වැඩ සහ කෙරිගෙන යන වැඩ අගය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මුදල් රෙගුලාස 133 ප්‍රකාරව "බී" සංරචකයේ ගනුදෙනු පිළිබඳව අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනයන්හි පෙන්වා ඇති කාර්යාල උපකරණ සම්බන්ධයෙන් වාර්ෂික භෞතික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

3.3 ව්‍යාපෘති පරිපාලන අත්පොත (PAM) සමග අනුකූල නොවීම

-------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි 15 ඡේදය අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මුලසුන දරන ජාතික නියාමන කමිටුව (NSC) මාසිකව රැස්විය යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී ජාතික නියාමන කමිටු රැස්වීම් වාර පවත්වා නොතිබුණි. එම නිසා ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි උපදෙස් අනුව, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන්ට ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් මග පෙන්වීමක් කිරීමට සහ සංරචකයේ සමස්ථ ප්‍රගතිය සමාලෝචනය කිරීමට කමිටුවට නොහැකි වී තිබුණි.

(ආ) ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි 115 ඡේදය අනුව මෙම ව්‍යාපෘතිය සඳහා ලංසු තැබීමේ ක්‍රියාපටිපාටිය, ලංසුකරුවන් සහ කොන්ත්‍රාත් පිරිනැමීම, ව්‍යාපෘතිය යටතේ ප්‍රදානය කරන ලද අරමුදල් යොදවන ආකාරය සහ භෞතික ප්‍රගතිය ඇතුළත්ව පිළියෙල කරන ලද වෙබ් අඩවියක් අමාත්‍යාංශයට තිබිය යුතුය. කෙසේ වුවද, 2013 අප්‍රියෙල් 30 දින වන විටත් එවැනි වෙන් කරන ලද වෙබ් අඩවියක් නිර්මාණය කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි 11 වන වගුව අනුව වර්ෂයකදී අවම වශයෙන් සමාලෝචන රැස්වීම් දෙකක්වත් පැවැත්විය යුතුය. කෙසේ වෙතත් විගණන කටයුතු සඳහා ලබා ගත හැකි වූයේ එක් සමාලෝචන වාර්තාවක් පමණි. එයට අමතරව සභාපතිට වාර්තා හා නිර්දේශ එහි පරිශිෂ්ඨ සමග (Report and Recommendations to the President), කාර්තුමය ව්‍යාපෘති කාර්යසාධන වාර්තා හා ව්‍යාපෘති තොරතුරු ලියවිල්ල සහ කාර්තුමය ප්‍රගති වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 3.4 අරමුදල් උපයෝජනය

පහත දැක්වෙන ප්‍රභේදයන් යටතේ ව්‍යාපෘතියේ "බී" සංරචකයේ කාර්යයන් ඉටු කිරීම සඳහා ණය සහ ප්‍රදාන යටතේ පිළිවෙලින් රු.මිලියන 5,212.3 ක් සහ රු.මිලියන 190.74 (ආසන්න වශයෙන්) ක් මූල්‍ය ප්‍රතිපාදනය කර තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට දරන ලද තථ්‍ය වියදම පහත දැක්වෙන පරිදි සපයන ලද අරමුදලෙන් රු.මිලියන 1,194.39 ක් සහ රු.මිලියන 178.19 ක් හෙවත් 22.9% ක් සහ 93.4% ක් විය.

| විස්තරය | ඇස්තමේන්තුගත වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම | සමුච්චිත වියදම මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | රු. මිලියන | රු. මිලියන | % |
| ආයෝජන පිරිවැය | | | | |
| සිවිල් වැඩ | 30.07 | 3,823.70 | 1,112.84 | 29.1 |
| උපකරණ සහ ලී බඩු | 1.68 | 213.63 | 4.86 | 2.3 |
| උපදේශක නිර්මාණ සහ අධීක්ෂණය | 0.3 | 38.15 | 6.29 | 16.5 |
| පුනරාවර්තන පිරිවැය | | | | |
| වර්ධක | 0.3 | 38.15 | 17.67 | 46.3 |
| ව්‍යාපෘති කළමනාකරණය - ව්‍යාපෘති සම්බන්ධීකරණ හා තත්ත්ව සහතික කිරීමේ ඒකකය | 1.37 | 174.21 | 29.35 | 16.85 |
| භෞතික සහ මිල අසම්භාව්‍යයන් | 6.29 | 799.84 | - | - |
| උප එකතුව | | 4,599.28 | 1,171.01 | 25.5 |
| මූල්‍ය ගාස්තු (බැදීම් ගාස්තු සහ පොලී) | 0.98 | 124.62 | 23.38 | 18.8 |
| උප එකතුව | | 5,212.30 | 1,194.39 | 22.9 |
| සිවිල් වැඩ - ප්‍රදාන | 1.5 | 190.74 | 178.19 | 93.4 |
| මුළු එකතුව | 42.49 | 5,403.04 | 1,372.58 | 25.4 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ "බී" සංරචකයේ කටයුතු 2013 ජූනි 30 වන විට නිම කිරීමට අපේක්ෂිතය. කෙසේ වෙතත් 2012 වර්ෂය අවසාන වන විට "බී" සංරචකය විසින් උපයෝජනය කර තිබුණේ අනුමත මුළු ප්‍රතිපාදනයෙන් 25.4% ක් පමණි. නියමිත කාල පරිච්ඡේදය තුළදී ව්‍යාපෘති "බී" සංරචකයේ කටයුතු නිම කිරීම සම්බන්ධයෙන් අවදානමක් පවතින බව ඒ අනුව නිරීක්ෂණය විය.

(ආ) සිවිල් වැඩ සඳහා රු. මිලියන 3,823.7 ක් වෙන් කර තිබුණු නමුත් අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණේ සමස්ථ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,112.84 ක් හෙවත් 29.1% ක් පමණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් සමස්ථ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ බී වගුවෙහි 12 වන ඡේදයට අනුව 2013 මාර්තු අවසාන වන විට සිවිල් වැඩ යටතේ බලය සහ ජල සැපයුම් ක්‍රියාකාරකම් සියල්ලම වාගේ සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඇ) ණය ගිවිසුමේ 3.02 වගන්තියට අනුව ණය ගන්නා විසින් වැය කරන ලද සහ වැය නොකරන ලද ණය මුදල මත පිළිවෙලින් පොලී සහ 0.15% ක්වූ බැඳීම් ගාස්තු ගෙවිය යුතුය. ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, ව්‍යාපෘතිය කටයුතු කර තිබුණේ නම් ගෙවන ලද බැඳීම් ගාස්තුව ගෙවන ලද පොලී මුදලට වඩා අඩු කර ගැනීමට හැකියාව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ "බී" සංරචකයේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් පොලී සහ බැඳීම් ගාස්තු වශයෙන් පිළිවෙලින් රු.5,181,958 ක් සහ රු.5,262,085 ක් "බී" සංරචකය වෙනුවෙන් ණය ගිණුමෙන් අය කරගෙන තිබුණි.

3.5 ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, සේවා පලපුරුද්ද සහ දක්ෂතාවයන් 2007 අප්‍රියෙල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.2.9 වගන්තියේ දක්වා ඇති පරිදි විය යුතුය. කෙසේ වතත්, ව්‍යාපෘතිය විසින් එම සුදුසුකම් සහ සේවා පලපුරුද්ද සපුරා නොමැති ඉංජිනේරු සහකාරවරයෙක් බඳවා ගෙන ඔහුගේ සේවා නියුක්ති කාලය තුළද එම නිලධාරියාට මාසික දීමනා වශයෙන් එකතුව රු.892,475 ක් ගෙවා තිබුණි.

3.6 නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා සමස්ථ ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි ව්‍යාපෘති වගකීම් නිශ්චය කර මාසික සහ කාර්තුමය වශයෙන් මූල්‍ය සහ භෞතික ඉලක්කයන් දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘති සම්බන්ධීකරණ හා තත්ත්ව සහතික කිරීමේ ඒකකය විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.